# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2387/38 - 2024 ජූනි මස 06 වැනි බ්‍රහස්පතින්දා - 2024.06.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.-බී. 3/2021 (III)

**2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත**

2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 27 වන, 28 වන සහ 45 වන වගන්ති සමග කියවිය යුතු, ඒ පනතේ 71 වන වගන්තිය යටතේ, කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව විමසා සහ අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලක මණ්ඩලයේ එකඟත්වය ඇතිව ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**රනිල් වික්‍රමසිංහ,**
ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය.

2024 ජූනි මස 05 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 2024 අංක 2 දරන කොළඹ වරාය නගරය (ගාස්තු) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මෙහි උපලේඛනයේ *I වැනි තීරයේ* නිශ්චිතව දක්වා ඇති එක් එක් කාර්යය සඳහා පනත යටතේ ගෙවිය යුතු ගාස්තු ප්‍රමාණය, එම උපලේඛනයේ *II වැනි තීරයේ* අනුරූපී සටහන්වල නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු ය. ඒ ගෙවීම් සිදු කරනු ලැබිය යුතු අවස්ථාව, එම උපලේඛනයේ *III වැනි තීරයේ* අනුරූපී සටහන්වල නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු ය.

3. මේ නියෝගවල -

"පනත" යන්නෙන්, 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත අදහස් වේ; සහ

"බලයලත් තැනැත්තා" යන්නට පනතේ ඊට දී ඇති අර්ථය ම තිබිය යුතු ය.

1A - PG 6747 — 364 (2024/06)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය** (2 වන නියෝගය)

ගාස්තු

| *I වැනි තීරය*<br>*කාර්යය* | *II වැනි තීරය*<br>*ගෙවිය යුතු ගාස්තු ප්‍රමාණය* | *III වැනි තීරය*<br>*ගෙවීම් කළ යුතු අවස්ථාව* |
|---|---|---|
| 1. බලයලත් තැනැත්තකු සඳහා ලියාපදිංචි කිරීමක් සහ බලපත්‍රයක් ලබා ගැනීම පිණිස ඉල්ලුම් කිරීම සඳහා වන ආපසු ගෙවනු නොලබන පිරිසැකසුම් ගාස්තුව | එ.ජ.ඩො. 5,000 | ඉල්ලුම් කිරීමේ දී ගෙවනු ලැබිය යුතු ය. |
| 2. ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාරයක් ලෙස සුදුසුකම් ලබන බලයලත් තැනැත්තකු සඳහා ලියාපදිංචි කිරීමක් සහ බලපත්‍රයක් ලබා ගැනීම පිණිස ඉල්ලුම් කිරීම සඳහා වන ආපසු ගෙවනු නොලබන පිරිසැකසුම් ගාස්තුව | එ.ජ.ඩො. 10,000 | ඉල්ලුම් කිරීමේ දී ගෙවනු ලැබිය යුතු ය. |
| 3. අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතුවල නිරත වීම පිණිස බලයලත් තැනැත්තකු සඳහා ලියාපදිංචි කිරීමක් සහ බලපත්‍රයක් ලබා ගැනීම පිණිස ඉල්ලුම් කිරීම සඳහා වන ආපසු ගෙවනු නොලබන පිරිසැකසුම් ගාස්තුව | එ.ජ.ඩො. 15,000 | ඉල්ලුම් කිරීමේ දී ගෙවනු ලැබිය යුතු ය. |
| 4. බලයලත් තැනැත්තකුගේ ලියාපදිංචියක් සහ බලපත්‍රයක් අලුත් කිරීම සඳහා වන වාර්ෂික අලුත් කිරීමේ ගාස්තුව | එ.ජ.ඩො. 2,500 | දැනට පවතින ලියාපදිංචිය සහ බලපත්‍රය කල් ඉකුත්වීමට මාස දෙකකට පෙරාතුව ගෙවනු ලැබිය යුතුය. |
| 5. ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාරයක් ලෙස සුදුසුකම්ලත් බලයලත් තැනැත්තකු සඳහා ලියාපදිංචියක් සහ බලපත්‍රයක් අලුත් කිරීම සඳහා වන වාර්ෂික අලුත් කිරීමේ ගාස්තුව | එ.ජ.ඩො. 5,000 | දැනට පවතින ලියාපදිංචිය සහ බලපත්‍රය කල් ඉකුත්වීමට මාස දෙකකට පෙරාතුව ගෙවනු ලැබිය යුතුය. |
| 6. අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතුවල නිරත වීම පිණිස බලයලත් තැනැත්තකු සඳහා ලියාපදිංචියක් සහ බලපත්‍රයක් අලුත් කිරීම සඳහා වන වාර්ෂික අලුත් කිරීමේ ගාස්තුව | එ.ජ.ඩො. 10,000 | දැනට පවතින ලියාපදිංචිය සහ බලපත්‍රය කල් ඉකුත්වීමට මාස දෙකකට පෙරාතුව ගෙවනු ලැබිය යුතුය. |
| 7. කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති යම් විස්තර වෙනස් කිරීම සඳහා වන ගාස්තුව | එ.ජ.ඩො. 100 | එම වෙනස් කිරීම සඳහා ඉල්ලුම් කිරීමේ දී ගෙවනු ලැබිය යුතුය. |
| 8. ලේඛනයක උද්ධෘතයක් හෝ ලියාපදිංචි කිරීමේ සහතිකයේ හෝ බලපත්‍රයේ සහතික කළ පිටපතක් ලබා ගැනීම සඳහා වන ගාස්තුව | එ.ජ.ඩො. 100 | එම උද්ධෘතය හෝ සහතික කළ පිටපත සඳහා ඉල්ලුම් කිරීමේ දී ගෙවනු ලැබිය යුතු ය. |

4. 2022 සැප්තැම්බර් මස 28 වන දින අංක 2299/47 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2022 අංක 01 දරන බලයලත් තැනැත්තා ලියාපදිංචි කිරීම හා බලපත්‍ර ලබාදීම (ගාස්තු) නියෝග මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

EOG 06 - 0045

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.